# සී/ස ලංකා නැව් සංස්ථාව

# වරාය හා නාවික අමාත්‍යාංශය

# ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා පවතින ඇබෑර්තු පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1) නියෝජ්‍ය කළමනාකරු තනතුර (මානව සම්පත්) - MM 1-1, II ශ්‍රේණිය (ඇබෑර්තු 1)

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින් සඳහා** :

1. අධ්‍යාපන සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර කළමනාකරණය/ විද්‍යා / වාණිජ / අලෙවිකරණය හෝ මානව සම්පත් පිළිබඳ උපාධිය

සහ

ඉහත සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රය තුළ රජයේ දෙපාර්තුමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක කළමනාකරණ තනතුරක (MM කාණ්ඩය) අවම වශයෙන් එක් (01) වසරක සතුටුදායක සේවය.

**අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා** :

1. ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්

හෝ

2. ක්ෂේත්‍රයට අදාලව කණිෂ්ඨ කළමනාකරු (JM 1-2) කාණ්ඩයේ හෝ ඊට ඉහළ තනතුරක අවම වශයෙන් පස් (05) වසරක සතුටුදායක සේවය

**සියලුම අපේක්ෂකයින් සඳහා** :

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ පශ්චාත් උපාධිය තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකණු ලැබේ.

## 2) නියෝජ්‍ය කළමනාකරු තනතුර (මූල්‍යය) - MM 1-1, II ශ්‍රේණිය (ඇබෑර්තු 1)

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින් සඳහා** :

1. අධ්‍යාපන සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර කළමනාකරණය/ විද්‍යා / වාණිජ / අලෙවිකරණය හෝ මානව සම්පත් පිළිබඳ උපාධිය

සහ

ඉහත සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රය තුළ රජයේ දෙපාර්තුමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක කළමනාකරණ තනතුරක (MM කාණ්ඩය) අවම වශයෙන් එක් (01) වසරක සතුටුදායක සේවය.

**අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා** :

1. ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්

හෝ

2. ක්ෂේත්‍රයට අදාලව කණිෂ්ඨ කළමනාකරු (JM 1-2) කාණ්ඩයේ හෝ ඊට ඉහළ තනතුරක අවම වශයෙන් පස් (05) වසරක සතුටුදායක සේවය

**සියලුම අපේක්ෂකයින් සඳහා** :

අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයක වෘත්තීය සුදුසුකම් (පූර්ණ/ අර්ධ වශයෙන්) තිබීම අමතර සුදුසුකමක් වේ.

## පොදු කොන්දේසි

**වැටුප් පරිමාණය** :

MM 1-1 – 2016 : රු. (53,175 -10 ×1375 -15× 1,910-95,575) සංශෝධිත වැටුප අනුව, 2020/01/01 දිනට MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණියේ මූලික වැටුප රු. 53,175/- ක් වේ. .

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

**වයස් සීමාව** :

වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** :

පත්කිරීමේ බලධාරියා විසින් පත්කළ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන තරඟකාරී ලිඛිත විභාගය සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

**පරිවාස කාලය** :

අවුරුදු 03 කි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී පොලී අනුපාත මත වාහන ණය

### සෑම අයදුම්කරුවෙකුම

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
- ඕනෑම අංශයක සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය

### පොදු උපදෙස්

සියලුම අයදුම්පත් සමග අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල පිටපත් තමා විසින්ම සහතිකකොට උප්පැන්න සහතිකය හා අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් **2021 අගෝස්තු 20** දින හෝ ඊට ප්‍රථම සභාපති, නො.27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය) , කොළඹ 01 ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**සභාපති**

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

**අංක 27, MICH ගොඩනැගිල්ල**

**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**

**කොළඹ 01**

Source: Dinamina, Daily News (2021.08.07)